'යහ පාලනය තුළින් විශිෂ්ටතම පළාත් පාලන සේවාවක් කරා'

# පළාත් පාලන දෙපාර්තමේන්තුව
## සබරගමුව පළාත් සභාව
## DEPARTMENT OF LOCAL GOVERNMENT
Sabaragamuwa Provincial Council
## உள்ளூராட்சி திணைக்களம்
சபரகமுவ மாகாண சபை

345

පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර.
Provincial Council Complex, New Town, Ratnapura.
மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம், இரத்தினபுரி.

මගේ අංකය / எனது இல / My Ref. CLG 1/04/02 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2016.01. 18

පපාකො චක්‍රලේඛ අංක: CLG/01/2016

සබරගමුව පළාතේ සියලුම
ප්‍රාදේශීය /නගර සභාවල ලේකම්වරුන් වෙත,

<u>පළාත් පාලන ආයතනවල මහජන සේවාවන් සැපයීම හා මූල්‍ය පරිපාලන කටයුතු විධිමත් කිරීම</u>

දැනට නිල කාලය අවසන් වී ඇති පළාත් පාලන ආයතන වල රාජකාරි කටයුතු ඉටු කිරීමේදී පිළිපැදිය යුතු උපදෙස් පිළිබඳව මගේ අංක CLG 2/1/1 හා 2015.05.18 දිනැති ලිපිය මගින් ඔබව දැනුවත් කර ඇත.

02. පළාත් පාලන ආයතනයක මහජන නියෝජිත මණ්ඩලයකට පැවරී තිබූ සමස්ථ බලතල කාර්යභාරය හා වරප්‍රසාද ආයතනයේ ලේකම් ලෙස රාජ්‍ය නිලධාරියෙකු වෙත පැවරී ඇති මෙවන් අවස්ථාවක රාජ්‍ය නිලධාරියෙකුගෙන් අපේක්ෂා කරනු ලබන අවංකභාවය, විනිවිද භාවය, කාර්යක්ෂමතාවය මෙන්ම ඵලදායි බවද අපේක්ෂා කරමින් සභාවේ කටයුතු පවත්වා ගෙන යාම හා සම්පත් කළමනාකරණය කිරීම ඔබගේ බලවත් වගකීමකි .එසේ කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් නිලධාරීන් විගණන විමසුම් වලට/අධිකාර වලට ලක්වීමද, පළාත් පාලන ආයතනය, පළාත් පාලන දෙපාර්තමේන්තුව, මහජනයාගේ අප්‍රසාදය/මහජන විරෝධතාවන්ට ලක්වීමටද අවකාශ ඇත.

03. මගේ අංක CLG 2/1/1 හා 2015.05.18 දින ඔබ වෙත නිකුත් කර ඇති උපදෙස් ලිපියේ සඳහන් කර ඇත්තේ සභා අරමුදල් වියදම් දැරීමේදී අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් වියදම් දරන ලෙසත්, එවකට බැඳී සිටි ගිවිසුම් වලට පමණක් වියදම් දැරීමට කටයුතු කල යුතු බවත් වේ. එහෙත් සභා අරමුදල් යොදවා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ගිවිසුම් වලට එළඹී කටයුතු කරමින් පවතින බවටද තොරතුරු වාර්තා වේ. එබැවින් මින් ඉදිරියේදී සභා අරමුදල් යොදවා කිනම් හෝ ආකාරයේ ප්‍රාග්ධන ස්වරූපයේ වැඩ, සැපයුම් හෝ සේවා ලබා ගැනීමට ප්‍රථම ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් දිස්ත්‍රික්කයේ සහකාර කොමසාරිස් හරහා මා වෙත ඉදිරිපත් කර පූර්ව අනුමැතියක් ලබා ගත යුතු බව මෙයින් අවධාරණය කරමි.

පළාත් පාලන කොමසාරිස් සබරගමුව පළාත | දුරකථන - 045 2222590 | ෆැක්ස් - 045 2230819 | ඊ මේල් spcclg@gmail.com
පළාත් පාලන සහකාර කොමසාරිස් රත්නපුර 045 2222274
පළාත් පාලන සහකාර කොමසාරිස් කෑගල්ල 035 2222274

01/19

04.එමෙන්ම මින් ඉදිරියේදී මෙම කාලවකවානුව තුළ ඔබගේ රාජකාරී කටයුතු වලට සහාය වීම පිණිස ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් සතියේ වැඩි කාලයක් ඔබගේ ආයතනයේ රැඳී සිටිනු ඇති බව වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

05.මෙම චක්‍රලේඛය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය මත නිකුත් කරනු ලැබේ.

ඩී.ඩබ්ලිව්.එස්.රාජපක්ෂ
පළාත් පාලන කොමසාරිස්
සබරගමුව පළාත

ඩී. ඩබ්ලිව්. එස්. රාජපක්ෂ
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

පිටපත් :-

1. ගරු ප්‍රධාන අමාත්‍යතුමා - සබරගමුව පළාත් සභාව - කා.දැ.ස.
2. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,ස.ප.ස. - කා.දැ.ස.
3. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, ස.ප.ස. -කා.දැ.ස.
4. සහකාර පළාත් පාලන කොමසාරිස් කෑගල්ල / රත්නපුර - දැනටමත් ඔබ වෙත දන්වා ඇති පරිදි ප්‍රජා සංවර්ධන නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් සතියේ වැඩි දින ගණනක් පළාත් පාලන ආයතනයේ අධීක්ෂණ රාජකාරී සඳහා යොදවන ලෙසත් සෑම දෙසතියකට වරක් එක් එක් පළාත් පාලන ආයතනය පිළිබඳව අදාළ නිලධාරියා වෙතින් යාකර ඇති ආකෘතිය අනුව වාර්තාවක් ලබා ගෙන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිතව මා වෙත එවීමටත් කටයුතු කළ යුතු වේ.